# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1876/27 - 2014 අගෝස්තු මස 19 වැනි අඟහරුවාදා - 2014.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 21/1978(xii).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

**27(1) වැනි වගන්තිය යටතේ නියමය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, මේ නියමය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත කලින් කල සංශෝධිත නැගෙනහිර විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ, 1986 සැප්තැම්බර් මස 26 වැනි දින හා අංක 420/25 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සහ අවසන් වරට 2010 ජුනි මස 17 වැනි දින අංක 1658/36 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ දැක්වෙන "පීඨය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "කලා හා සංස්කෘතික පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ "අධ්‍යයන අංශ" යන ශීර්ෂය යටතේ දැක්වෙන අයිතමවල 9 වැනි අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතිමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"10. හින්දු ශිෂ්ටාචාර අංශය.".

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

09-88


1A - PG 2148— 505 (2014/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.